සියළුම හිමිකම ඇවිරිණි]
All Rights Reserved ]

# පාසල් වලට සිසුන් තොරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

I පත්‍රය

නැණ ලොවට පා නඟන හපනුන්ට මඟ කියන
"අදිති"

පැය 01 යි

1

විභාග අංකය ..............................

## විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

"අදිති" ප්‍රශ්න පත්‍ර පිළිතුරු හා ගැටලු සඳහා TV සත්සල් හා anueducation.lk භාවිතා කරන්න

● අංක 1 හා 2 ප්‍රශ්නවල දී ඇති රූපය හොඳින් විස්තර කෙරෙන වචන ඇතුළත් පිළිතුර තෝරන්න.

(1)



(i) කැලේ රජා , ශාක භක්ෂක , බුද්ධිමත්

(ii) ශාක භක්ෂක , බුද්ධිමත් , සිවුපා

(iii) බුද්ධිමත් , මාංශ භක්ෂක , දිවාචර

(2)





(i) උදේට පිපෙන , සුවඳ , සුදුපාට පමණි

(ii) විවිධ පාට , සුවඳ , සවස පිපෙන

(iii) උදේට පිපෙන , සුවඳ , විවිධ පාට

● පහත කොටු තුළ ඇති රූප නිරීක්ෂණය කරන්න. එක් එක් රූපය සඳහා ඉංග්‍රීසි අකුරු යොදා ඇත. එම රූපවල හොඳ ම සම්බන්ධතාව දැක්වෙන පරිදි රූප යුගල කර ඇති පිළිතුර තෝරන්න.

| | | | |
|---|---|---|---|
| A  | B  | C  | D  |
| E  | F  | G  | H  |

(3) (i) A:D – C:G – F:H (ii) D:A – C:E – F:H (iii) A:F – E:H – C:H

● පහත කොටු තුළ දැක්වෙන්නේ පලතුරු වර්ග කීපයක මිල ගණන් ය. ඒ ඇසුරෙන් 4 සහ 5 ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරන්න.



රු.55.00



රු.45.00



රු.70.00

(4) ජම්බු ගෙඩියක මිල කීය ද ?

(i) රු.20.00 (ii) රු.25.00 (iii) රු.15.00

(5) ජම්බු, ඇපල් සහ ගස්ලබු ගෙඩි 2 බැගින් ගත් අයෙක් ගෙවිය යුතු මුදල කීය ද ?

(i) රු.85.00 (ii) රු.65.00 (iii) රු.170.00

(6) එක ළඟ පිහිටි සංඛ්‍යා 3ක එකතුව 84කි. එම සංඛ්‍යා මොනවා ද ?

(i) 22, 27, 35 (ii) 23, 24, 25 (iii) 27, 28, 29

(7) සිසුවා : නම නම්, ප්‍රශ්න පත්‍රය : ..................................

(i) විභාග අංකය (ii) විභාගයේ නම (iii) ප්‍රශ්න සහ පිළිතුරු

**● පහත කොටුව තුළ ඇති අක්ෂර සහ ඉලක්කම් ඇසුරෙන් 8,9 සහ 10 ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරන්න.**

| H84 N4T4FP79EN9B |
|---|

(8) මෙහි වැඩියෙන් ම ඇත්තේ,

(i) 4 ඉලක්කම (ii) අක්ෂර (iii) ඉලක්කම්

(9) මෙහි එක ළඟ පිහිටි සංඛ්‍යා 2ක් ගුණ කළ විට පිළිතුර ලෙස 63 ලැබෙන බව ඔව්දි පවසයි. එම සංඛ්‍යා දෙක කුමක් ද ?

(i) 8 සහ 4 (ii) 9 සහ 8 (iii) 7 සහ 9

(10) තමා උපන් රටට ආදරය කරන්නා,

(i) දේශප්‍රේමියා (ii) තක්කඩියා (iii) දේශද්‍රෝහියා

(11) 3 සිට 6 දක්වා ඇති සංඛ්‍යාවල එකතුව කීය ද ?

(i) 18 (ii) 12 (iii) 9

(12) අවුරුදු ක්‍රීඩා උත්සවයක තිබුණු තරග අතරින් ලිස්සන ගසේ නැගීම සඳහා ඔනෙත් සහභාගී විය. මෙහිදී සෑම විට ම අඩි 4ක් ඉහළ නගින විට අඩි 2ක් පහළට ලිස්සා ඒමක් සිදුවෙයි. මේ අයුරින් අඩි 26ක් උස ලිස්සන ගසේ මුදුනට යාමට ඔනෙත්ට හැකිවන්නේ කී වැනි වතාවේ දී ද ?

(i) 11වැනි වතාවේ දී (ii) 12වැනි වතාවේ දී (iii) 13වැනි වතාවේ දී

(13) දානයක් නිමවීමෙන් පසු එතැන සිටි මිනිසුන් 34 දෙනෙක් අතරින් 21 දෙනෙක් අයිස් ක්‍රීම් ද, 17 දෙනෙක් කිරි පැණි සහ අයිස් ක්‍රීම් යන දෙකම ද කෑවේ නම්, අයිස් ක්‍රීම් පමණක් කෑ අය ගණන කීය ද ?

(i) 4 (ii) 13 (iii)9

**● නදීප් ළඟ තිබෙන වීදුරු බෝල ප්‍රමාණයන් පහත දැක්වේ. ඒ ඇසුරෙන් 14 සහ 15 ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරන්න.**

| අඩුයි ← වැඩි යි<br>වැඩියි → අඩුයි | නිල් → කහ | කහ → රතු |
|---|---|---|

(14) නදීප් ළඟ වැඩිපුර ඇත්තේ මොන පාට බෝල ද ?

(i) රතු (ii) කහ (iii) නිල්

(15) ආශිංස විසින් මෙම වීදුරු බෝල අඩු බවේ සිට වැඩි බවට පෙළගැසුවේ නම් එහි නිවැරදි පිළිතුර කුමක්ද ?

(i) නිල්, කහ, රතු (ii) නිල්, රතු , කහ (iii) රතු, කහ, නිල්

(16) පන්තිභාර ගුරුතුමිය විසින් බිනුකටත්, භාග්‍යාටත් සිසුන් 5 දෙනෙක් යොදාගෙන කණ්ඩායමකට තිදෙනා බැගින් වන සේ එකිනෙකට වෙනස් කණ්ඩායම් හැකි තරම් සාදා පෙන්වන ලෙස කීවා ය. බිනුකත්, භාග්‍යාත් එසේ සෑදිය හැකි වැඩි ම කණ්ඩායම් ගණන සාදා පෙන්වූවෝ ය. එම ගණන කීය ද ?

(i) 10 (ii) 12 (iii) 15

(17) වැස්සට පෙර බොහෝ අවස්ථාවල දී අහස ගොරවයි. අහස ගොරවන සෑම අවස්ථාවකදී ම අකුණු ගසයි. මේ අනුව පහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(i) වැස්සට පෙර බොහෝ අවස්ථාවල අහස ගෙරවීම සහ අකුණු ගැසීම සිදු වේ .
(ii) වසින සෑම අවස්ථාවකදී ම ගෙරවීමත් අකුණු ගැසීමත් සිදු වේ .
(iii) ගෙරවීමත් අකුණු ගැසීමත් සිදුවන සෑම අවස්ථාවක ම වැසි වසියි.

(18) සමචතුරස්‍රාකාර ඉඩමක් වටේ සමාන පරතරයෙන් කණු සිටුවා ඇත. එහි පැත්තක දිග මීටර් 24කි. එහි එක් පැත්තක කණු 9ක් සිටුවා ඇත්නම් එම කණු දෙකක් අතර පරතරය කොපමණ ද ?

(i) 3m (ii) 5m (iii) 4m

(19) සෙතුම්ට වඩා කුෂාණි ලකුණු ලබාගත් නමුත් සනුජ්ට වඩා අඩු ය. තනුම් බිනුරිට වඩා ලකුණු අඩු නමුත් සනුජ්ට වඩා ලකුණු ලබා ඇත. වත්මිට වඩා ගිම්සරා ලකුණු අඩුවෙන් ගත් නමුත් ගිම්සරාගේ ලකුණු බිනුරිට වඩා වැඩි ය. මේ විස්තරයට අනුව වැඩි ම ලකුණු ඇත්තේ කාට ද ?

(i) ගිම්සරාට (ii) සනුජ්ට (iii) වත්මිට

(20) 4000 බාගයෙන් 1500 ක් අඩු කර එයට 200න් කාලක් එකතු කළ හොත් ලැබෙන අගය වනුයේ

(i) 550 (ii) 2700 (iii) 2050

(21) පිටු 120ක් ඇති පොතක පිටු අංක 9 සහ 10 සහිත කොළය කැඩී ගොස් ඇත. ඒත් සමග කැඩී ඉවත්වීමට ඉඩ ඇති එහි අනෙක් පැත්තේ ඇති කොළයේ සඳහන් අංක මොනවා ද ?


(i) 101 සහ 102 (ii) 118 සහ 119 (iii) 111 සහ 112

(22) නිවැරදි සම්බන්ධතාවයක් දැක්වෙන පිළිතුර තෝරන්න.

A. රන් පොළොවේ ලී නඟුලෙන් ඉරි ඇන්දා
B. බිං හීයට දහ අට බානක් බැන්දා
C. අම්බරුවනේ රට රැකුනේ තොපි හින්දා
D. නැම් බඹරේ මහ කුඹුරේ දිය බැන්දා

(i) CBDA (ii) DBAC (iii) DABC

● **රූප සටහන බලා පිළිතුරු සපයන්න.**




(23) නිවසේ සිට ඔරලෝසු කණුව තෙක් යන අයෙක් දකුණු දිශාවට කී වාරයක් ගමන් කරන්නේ ද ?

(i) 3 වාරයක් (ii) 2 වාරයක් (iii) 4 වාරයක්

(24) අන්තර් සම්බන්ධතාවක් දක්නට නැති වචන සහිත කොටුව තෝරන්න.

| (i) | (ii) | (iii) |
|---|---|---|
| ඉර<br>හිරු<br>දිනකර | අඹර<br>ගුවන<br>අහස | බැල්ලී<br>බළලා<br>සෙබඩ |

(25) 2026 වර්ෂයේ හරි මැද දිනය යෙදෙන්නේ කවදාට ද ?

(i) ජූලි 2 (ii) ජූලි 1 (iii) ජූනි 30

(26) 2026 සාමාන්‍ය අවුරුද්දකි. 2025 ජනවාරි 1 වැනිදා බදාදාවක් නම් 2027 ජනවාරි 1 වැනිදා දවස කුමක් ද ?

(i) සිකුරාදා (ii) බ්‍රහස්පතින්දා (iii) බදාදා

(27) නෙතුකිගේ මල්ලී හිමංස ඉපදී අවුරුද්දක් වන විට ඇගේ තාත්තා මාස 4ක් වයස ඇති පූස් පැටියෙක් නිවසට ගෙනාවේ ය. හිමංසගේ වයස පූස් පැටියාගේ වයස මෙන් දෙගුණයක් වන්නේ තව මාස කීයකින් ද ?

(i) මාස 4　　(ii) මාස 5　　(iii) මාස 6

(28) 47ට 29ක් එකතු කළ විට ∗Ω ලෙසත්, 72න් 37ක් අඩු කළ විට ⊗∅ ලෙසත් රහස් සංකේත යොදාගෙන පිළිතුරු සපයා තිබුණි. ඒ අනුව 3765 රහස් සංකේත යොදාගෙන ලියා ඇති පිළිතුර තෝරන්න.

(i) ⊗∗∅Ω　　(ii) ⊗∗Ω∅　　(iii) Ω∗⊗∅

(29) පන්තියක සිටින ගැහැනු සහ පිරිමි ළමයින් සංඛ්‍යාවේ එකතුව 35කි. පිරිමි ළමයින් සංඛ්‍යාව ගැහැනු ළමයින් සංඛ්‍යාවට වඩා 7ක් වැඩියි නම් පන්තියේ සිටින ගැහැනු ළමයින් සංඛ්‍යාව කීය ද ?

(i) 14　　(ii) 17　　(iii) 21

(30) මනුජ් සහ හේෂාන් පාසල් නාට්‍යයක් සඳහා පුහුණුවන සිසුන් දෙදෙනෙකි. දඩයක්කරුවෙකුගේ උගුලකට හසු වූ සතෙකුට අභයදානය දෙන ලෙස දරුවෙකු විසින් කරනු ලබන ඉල්ලීමක් එහි දී කළ යුතුව තිබුණි. එය සන්නිවේදනය කළ යුතු නිවැරදි ආකාරය කුමක් ද ?

(i) මරන්න, එපා නිදහස් කරන්න

(ii) මරන්න එපා, නිදහස් කරන්න

(iii) එපා නිදහස් කරන්න, මරන්න

(31) තනුම් තම නිවසේ දී ක්‍රියාකාරකමක් කිරීම සඳහා වයර් කැබැල්ලක් ගෙන එය සමාන දිගින් යුත් කුඩා කැබලි කීපයක් ලැබෙන සේ ස්ථාන හතරකින් කැපූ පසු, එක් කුඩා කැබැල්ලක දිග 15cm විය. කැපීමට පෙර වයරයේ තිබූ දිග කොපමණ ද ?

(i) 75 cm　　(ii) 145 cm　　(iii) 90 cm

(32) ඉතිරිකිරීමේ පුරුද්ද ඇති කිරීම සඳහා ගගුල්ගේ පියා ඔහුට කැටයක මුදල් දැමීමට හුරු කළේ ය. දිනක් එය බිම වැටී බිඳී ගියේ ය. එහි තිබුණේ රු.2 කාසි සහ රු.5 කාසි 22කි. ඒවායෙහි මුළු වටිනාකම රු.83.00ක් නම් ගගුල්ගේ කැටයේ තිබුණු රු.2 කාසි ගණන කීය ද ?

(i) 13　　(ii) 11　　(iii) 9

(33) මනතුංග මහතා උපන්නේ 2000 වර්ෂයේ නම් ඔහු උපන් වර්ෂය අයත්වන සියවස හා දශකය පහත පිළිතුරු අතරින් තෝරන්න.

(i) 20වන සියවස 9වන දශකය

(ii) 20වන සියවස 10වන දශකය


(iii) 21වන සියවස 1වන දශකය

(34) සංඛ්‍යා රටා දෙකකට අයත් සංඛ්‍යා පහත කොටුව තුළ අපිළිවෙළට දැක්වේ. එම එක් එක් සංඛ්‍යා රටාවල තිබිය යුතු මැද සංඛ්‍යා එක බැගින් අඩු ය. රටා දෙකේ එලෙස අඩු වී ඇති සංඛ්‍යා දෙක තෝරන්න.

13, 40, 10, 8, 28, 50, 18, 20

(i) 23 සහ 30 (ii) 21 සහ 35 (iii) 15 සහ 25

- **නෑදෑකම් සටහන බලා පිළිතුරු සපයන්න.**





(35) ඔකිත නදීෂාට ඇමතිය යුතු නෑකම වනුයේ,

(i) නංගී (ii) නැන්දා (iii) පුංචි අම්මා

(36) නෑකම අනුව දමයන්ති යනු අමරාවතීගේ කවුද ?


(i) ලේලි (ii) නෑනා (iii) නංගී

(37) පහත රූප අතරින් සිරස් රේඛා, තිරස් රේඛා සහ ආනත රේඛා සමාන ගණනක් ඇති රූපය තෝරන්න.




(i) 1 (ii) 2 (iii) 3

**● මෙම සැලැස්මෙහි ඇති වෘත්තාකාර මාර්ග ඔස්සේ A වටා එක් වටයක් ගමන් කිරීමට 9kmක දුරක් ද, B වටා එක් වටයක් ගමන් කිරීමට 6kmක දුරක් ද ගමන් කළ යුතු ය.**




(38) අධීෂා I සිට G හරහා E වෙත පැමිණ, ඉන් පසු F හරහා C වෙත ගමන් කළේ නම් ඇය ගෙවා දැමූ දුර ප්‍රමාණය කොපමණ ද ?

(i) 7km 500m (ii) 6km 500m (iii) 7km

(39) ළමයෙක් පෙරවරු 8.30ට පමණ පාසල් මිදුලේ සිටගෙන සිටියි. එවිට ළමයාගේ සෙවණැල්ල තම වම් අත පැත්තට වැටී තිබුණේ නම් ළමයා පිටුපා සිටින දිශාව කුමක් ද ?

(i) දකුණ (ii) බස්නාහිර (iii) උතුර

(40) දහසය දහස් අටසිය එකොළහ යන සංඛ්‍යාවේ ඇති ඉලක්කම් වලින් අහඹු ලෙස ඉලක්කම් තුනක් ගෙන එකතු කළහොත්, එකතුවට ලැබෙන අඩු ම අගය කීය ද ?

(i) 15 (ii) 3 (iii) 8